# ලංකා විදුලිබල මණ්ඩලය

## පුනර්ජනනීය බලශක්ති සංවර්ධන ශාඛාව

# ඇබෑර්තු

# පරිසර විශේෂඥ තනතුර

## කොන්ත්‍රාත් පදනම මත අවුරුදු 02 ක කාලයක් සඳහා

විදුලිබල හෝ කාර්මික ව්‍යාපෘතිවල පරිසර කළමනාකරණය පිළිබඳ පූර්ව පළපුරුද්දක් ඇති ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් පහත දැක්වෙන සුදුසුකම්, පළපුරුද්ද සහ වෘත්තීය හැකියාවන් ඇති අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**සුදුසුකම්, පළපුරුද්ද සහ වෙනත් අවශ්‍යතා :**

- ශ්‍රී ලංකාවේ හෝ සමාන සුදුසුකම් ඇති ලෙස පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් උපාධියක්.
- පරිසර විද්‍යාව, පරිසර කළමනාකරණය හෝ සබැඳි ක්ෂේත්‍රයක පශ්චාත් උපාධියක් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගෙන තිබිය යුතුය.

**පළපුරුද්ද :**

- මහාමාර්ග ඉදිකිරීම, සුළං විදුලි බලාගාර ඉදිකිරීම්, ග්‍රිඩ් උපපොළ හෝ අධිවෝල්ටීයතා සම්ප්‍රේෂණ රැහැන් ඉදිකිරීම් ව්‍යාපෘතිවල පරිසර/ සමාජ ආරක්ෂක කටයුතු පිළිබඳ අවම වශයෙන් වසර 10ක පළපුරුද්දක් තිබිය යුතුය.
- මාර්ග හා විදුලිබල ව්‍යාපෘති සඳහා ඉඩම් අත්පත් කර ගැනීම පිළිබඳ පළපුරුද්දක් තිබීම අමතර සුදුසුකමක් වනු ඇත.

**වයස :**

- වයස අවුරුදු 45ට අඩු විය යුතුය. වයස 45 ඉක්මවූ අය විශේෂ අවස්ථාවලදී පමණක් සලකා බැලේ.

**වෘත්තීය හැකියාවන් :**

- ව්‍යාපෘති පරිසර කටයුතු ස්වාධීනව සිදු කිරීමේ හැකියාව.
- කණ්ඩායම් වැඩවලදී විශ්වාසය සහ සහයෝගීතාව ඇති කරන ලෙස කටයුතු කිරීමේ හැකියාව.
- තම ක්ෂේත්‍රයට අදාළ පාරිසරික ක්‍රියාත්මක කිරීමේ ගැටලු විශ්ලේෂණය කර විසඳීමේ හැකියාව.
- ජාතික ඉඩම් අත්පත් කර ගැනීමේ පනත්, නැවත පදිංචි කිරීමේ ප්‍රතිපත්ති සහ පාරිසරික/සමාජ ආරක්ෂණ ක්‍රම පිළිබඳ මනා දැනුමක්.
- ඉඩම් හිමියන්, පළාත් පාලන ආයතන සහ ප්‍රජා සාමාජිකයින් සමඟ කටයුතු කිරීම සඳහා ශක්තිමත් අන්තර් පුද්ගල කුසලතා සහ සන්නිවේදන හැකියාව.
- පරිගණක දැනුම.
- සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා තුනෙහිද ඉහළ සන්නිවේදන හැකියාව.

**අයදුම්පත් භාරගන්නා අවසාන දිනය : 2025.05.22 දින.**

**තෝරාගැනීම : සම්මුඛ පරීක්ෂණයක් මඟිනි (කෙටි ලැයිස්තුගත අපේක්ෂකයින් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ).**

**සේවයට අදාළ කොන්දේසි :**

- සේවය සඳහා බඳවාගැනීම අවුරුදු දෙකක (02) කාලයක් සඳහා කොන්ත්‍රාත් පදනම මත වනු ඇත.
- තෝරාගත් අයදුම්කරුවන් ප්‍රධාන වශයෙන් උතුරු පළාතේ පිහිටි ව්‍යාපෘති වැඩබිම්වල සේවය කළයුතු අතර අමතර පැය වැඩකිරීමට හැකිවිය යුතුය.

**වැටුප් හා වේතන :**

- ශ්‍රී ලංකා විදුලිබල මණ්ඩලයේ S3 වැටුප් ශ්‍රේණියේ ආරම්භක පියවරක් අනුව වේ.

**වෙනත් ප්‍රතිලාභ :**

- තෝරා ගන්නා ලබන අයදුම්කරුවන් විසින් සේවක අර්ථ සාධක අරමුදලට (EPF) තම වැටුපෙන් 10% දායකත්වය ලබාදිය යුතු අතර ලංකා විදුලිබල මණ්ඩලය විසින් 15% ප්‍රමාණයකින් ඊට දායකත්වය ලබා දේ.
- සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලට (ETF) 3% දායකත්වය ලංකා විදුලිබල මණ්ඩලය විසින් ලබා දේ

ඉහත සුදුසුකම් සහිත අයදුම්කරුවන් විසින් තම සම්පූර්ණ නම, පුද්ගලික සහ රාජකාරි ලිපිනය, තොරතුරු විමසිය හැකි ඥාතීන් නොවන පුද්ගලයින් දෙදෙනෙකුගේ විස්තර හා දුරකථන අංක සහිත සම්පූර්ණ අයදුම්පත්‍රයක් (ඉංග්‍රීසි භාෂාවෙන් පුරවන ලද) ලියාපදිංචි තැපෑලෙන් පහත සඳහන් ලිපිනය වෙත අයදුම්පත් භාරගන්නා අවසන් දිනට හෝ ඊට පෙර ලැබෙන සේ එවිය යුතුය. ලිපි කවරයේ වම් ඉහළ කෙළවරේ "පරිසර විශේෂඥ තනතුර – පුනර්ජනනීය බලශක්ති සංවර්ධන ශාඛාව" යනුවෙන් සටහන් කළ යුතුය.

රාජ්‍ය දෙපාර්තමේන්තු හෝ රාජ්‍ය ආයතනවල දැනට සේවයේ නියුතු අයදුම්කරුවන් තම අයදුම්පත්‍ර තම ආයතන ප්‍රධානියා මගින් එවිය යුතු අතර, යම් හෙයකින් තෝරා ගතහොත් නිදහස් කළ හැකිද යන්න පැහැදිලිව සඳහන් කළ යුතුය.


**වැඩිදුර තොරතුරු සඳහා :**

**නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (පු.බ.සං. ශාඛාව)**
**දු.අංකය: 0112889640**
**ෆැක්ස්: 0112869631**

**ලිපිනය :**
**නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (පු.බ.සං.)**
**ලංකා විදුලිබල මණ්ඩලය,**
**අංක 949/A/1, T.C. උද්‍යාන පාර,**
**පන්නිපිටිය පාර, බත්තරමුල්ල.**


ලංකා විදුලිබල මණ්ඩලය
இலங்கை மின்சார சபை
CEYLON ELECTRICITY BOARD

විදුලිබලයෙන් සැජිමත් දිවියක්